# පාරිභෝගික කටයුතු අධිකාරිය

## සමුපකාර සේවා, අලෙවි සංවර්ධන හා පාරිභෝගික ආරක්ෂණ රාජ්‍ය අමාත්‍යාංශය

# පුරප්පාඩු

පාරිභෝගික කටයුතු අධිකාරියේ පවතින පහත සඳහන් පුරප්පාඩුව පිරවීම සඳහා යථා යෝග්‍ය පරිදි සුදුසුකම්ලත් අයවළුන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

## අධ්‍යක්ෂක තනතුර - (නෛතික හා බලාත්මක කිරීම්) - (HM 1-1) - තනතුරු 01

**රැකියා විස්තරය :**

ඕනෑම අධිකරණයක්, විනිශ්චය සභාවක් හෝ අධිකාරියක් ඉදිරියේ අධිකාරිය නියෝජනය කිරීම, අධිකාරිය වෙනුවෙන් නඩුකීමේ දැන්වීම භාර ගැනීම සහ අවශ්‍යයැයි හැඟෙන අවස්ථාවන් හා තැන්හිදී අධිකාරිය වෙනුවෙන් පෙනී සිටීම හා නියෝජනය කිරීම, පනත විසින් නියමිත කර ඇති පරිදි අධිකාරියේ ක්‍රියා කටයුතු වලට අනුකූලව ක්‍රියා කිරීම හා ඒවා බලාත්මක කිරීම, පාරිභෝගික කටයුතු අධිකාරි පනත යටතේ නිකුත් කරනු ලබන නියෝගයන්ට අනුකූලව ක්‍රියා කිරීමට නිෂ්පාදකයින් හා වෙළඳුන් අපොහොසත්වන අවස්ථාවන්හිදී එවන් කාරණා කටයුතු හා නඩු කටයුතු විමර්ශනය කිරීම හා පනත විසින් නියම කර ඇති පරිදි ඒ සඳහා හා ඒ අනුව නීතිමය පටිපාටිකර ස්ථාපනය කිරීම / නඩු පැවරීම, නීතිපති දෙපාර්තමේන්තුව වෙනත් නීතිමය උපදේශකයින් හා අදාළ ආයතන සමග අවශ්‍ය අවස්ථාවලදී සම්බන්ධීකරණය පවත්වාගෙන යාම, ඕනෑම නිෂ්පාදකවරයෙකු හෝ වෙළෙන්දෙකු හෝ ඕනෑම නිෂ්පාදක හෝ වෙළඳ ආයතනයන් හා සමග පනත විසින් පනවා ඇති හා නියමිත පරිදි, අධිකාරිය විසින් එළඹෙනු ලබන ගිවිසුම් පිළියෙල කිරීම හා බලාත්මක කිරීම පිළිබඳ වගකීම් භාරය දැරීම, අධිකාරිය විසින් නිකුත් කරනු ලබන සියලුම නියෝගයන් හා උද්දේශයන්ට අදාළ වාර්තා පවත්වාගෙන යාම හා නඩත්තු කිරීම, අධිකාරිය විසින් සංස්ථාපිත වෙනත් නෛතික කාර්ය පටිපාටි පිළිබඳවද වාර්තා පවත්වාගෙන යාම, පාරිභෝගික පැමිණිලි ඒකකයේ කටයුතු අධීක්ෂණය කිරීම / නිරීක්ෂණය කිරීම, අධිකාරිය විසින් නිකුත් කරනු ලැබීමට නියමිත ගැසට් දැන්වීම් / නිවේදන පිළියෙල කිරීම, අධිකාරියේ දිස්ත්‍රික් කාර්යාල විසින් මෙහෙයවනු ලබන නෛතික කටයුතු සම්බන්ධීකරණය කිරීම හා අධීක්ෂණය කිරීම, අධිකාරියේ කාර්ය කටයුතු පිළිබඳව එහි කාර්ය මණ්ඩලයට උපදෙස් දීම හා පැහැදිලි කිරීම, නියෝගයන්ට / උද්දේශයන් සහ / හෝ රෙගුලාසි / නියමයන් මගින් එහිදී අරමුණු ගත කර ඇති මාර්ගෝපදේශ අර්ථ නිරූපනය කිරීම, අධිකාරියේ වෙනත් සියලු අංශවලට සහය සේවා සැපයීම පාරිභෝගික කටයුතු සභාව සඳහා සහය සේවා සැපයීම පාරිභෝගික ආරක්ෂණ හා ප්‍රති – තරගකාරී පරිචයන් / භාවිතාවන් හා කටයුතු කරන්නාවූ ජාත්‍යන්තර තලයේ / ක්ෂේත්‍රයේ නීතිමය සංවර්ධන කටයුතු පිළිබඳ අවධානය හා අවබෝධය පවත්වා ගැනීම හා පහත දැක්වෙන කරුණු කාරණා පිළිබඳ අධිකාරියේ අධ්‍යක්ෂක ජනරාල්වරයාට සහ සාමාජිකයින්ට සහය ලබා දීම.

(i) නඩු කීම් කටයුතු හා සම්බන්ධව ඕනෑම කාරණාවකදී අවශ්‍යවන පැහැදිලි කිරීම් සැපයීම.

(ii) අර්ථ නිරූපනයන්

(iii) නියාමකයෙකු ලෙස ප්‍රතිපත්තිමය තීරණ ගැනීමේදී අදහස් / මත ප්‍රකාශ ක්‍රමවත්ව / විධිමත්ව දැක්වීම

(iv) කාර්ය මණ්ඩලය, ශ්‍රමිකයන්, ශ්‍රමය, සුභසාධක වන්දි ගෙවීම හෝ විනය පිළිබඳ කටයුතු වලදී හට ගැනෙන වෙනත් ඕනෑම දරාගැනීමක් කල් පැවැත්මක්

සහ

(v) අධිකාරිය හා සම්බන්ධව එහි ක්‍රියාවන් සහ හෝ බැඳියාවන් / අභිලාෂයන් පිළිබඳව සෘජුවම අධිකාරිය සම්බන්ධ වන වෙනත් ඕනෑම හා වැඩිමනත් ගැටළු හා කාරණා හා වෙනත් කරුණු.

**සුදුසුකම් :**

**බාහිර** : නීතිඥවරයෙකු වීම හා පශ්චාත් උපාධි සුදුසුකම් (Masters) හා සමග දිවුරුම් දීමෙන් පසු රාජ්‍ය සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ පිළිගත් වෙළඳ ආයතනයක කළමනාකරණ මට්ටමේ වසර 15 ක පශ්චාත් යෝග්‍යතා පළපුරුද්ද

**අභ්‍යන්තර** : තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයක කළමනාකරු ප්‍රවර්ගයේ 1 වන ශ්‍රේණියේ තනතුරක අවම වශයෙන් වසර පහක (05) ක සතුටුදායක සේවය.

**වැටුප් පරිමාණය** : HM 1-1-2016 : රුපියල් (81,670-15x2,270-115,720) – (2016/02 අංකය දරන DMS චක්‍රලේඛය ප්‍රකාරව)

**දීමනා** : ඉහත වැටුපට අමතරව ජීවන වියදම් දීමනාව වෘත්තියවේදී දීමනාව සහ වෙනත් අදාළ දීමනා සියල්ලද අදාළ රජයේ චක්‍රලේඛයන් පරිදි ගෙවනු ලැබේ.

**ප්‍රවාහන සහ ඉන්ධන දීමනාව :** නිල වාහනයක් භාවිතා කිරීමට හෝ මාසික ප්‍රවාහන දීමනාව වන රු. 50,000.00 ක මුදලක්ද ලීටර් 120 ක ඉන්ධන දීමනාවක්ද ලබාගැනීමට හිමිකම් හා පහසුකම් ඇත.

**වයස** : අවුරුදු 35 ට නොඅඩු සහ 55 ට නොවැඩි විය යුතුය. මෙම ඉහළ වයස් සීමාව අභ්‍යන්තර අපේක්ෂකයින් හට අදාළ නොවනු ඇත.

**පොදු කොන්දේසි :**

**බඳවා ගැනීමේදී වැටුප** : බාහිරව බඳවා ගනු ලබන අයවළුන් වැටුප් පරිමාණයේ මූලික තලයේ පිහිටුවනු ලැබේ. අභ්‍යන්තරව බඳවා ගනු ලබන අයවළුන්ගේ වැටුප් ආයතන සංග්‍රහය – I හි VII වන පරිච්ඡේදයේ විධිවිධාන / ප්‍රතිපාදන අනුව තීරණය කරනු ලැබේ.

**පත්වීමේ ස්වභාවය** : තනතුර ස්ථිර වන අතර, සේවක අර්ථ සාධක අරමුදලට සහ සේවා නියුක්තයින්ගේ භාර අරමුදලට හිමිකම් ඇති අතර අදාළ වැටුප් රජයේ චක්‍ර ලේඛයන්හි සඳහන් විධිවිධාන / ප්‍රතිපාදන පරිදි ගෙවනු ලැබේ.

- තනතුරට පත් කරනු ලබන බාහිර අයදුම්කරුවෙකු වසර (03) තුනක කාල සීමාවක් සහන පරිවාස කාලයකට ලක් කරනු ලැබේ.

**වෙනත්**

- ශ්‍රී ලාංකීය පුරවැසියෙකු විය යුතුය.
- දිවයිනේ ඕනෑම පළාතක සේවය කිරීමට සූදානම්ව සිටිය යුතුය.
- තනතුරට පැවරෙන රාජකාරී මැනවින් ඉටුකිරීමට හැකි වනසේ මනා කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.
- අනර්ඝ හා විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

යෝග්‍යතාපූර්ණ අපේක්ෂකයින් මෙම දැන්වීමේ දින සිට දින 14 ක් ඇතුළත 2021/07/23 වන දිනට හෝ ඊට පෙර ලැබෙන සේ පහත සඳහන් ලිපිනයට සිය අයදුම්පත් ලේඛනගත තැපෑලෙන් ඉදිරිපත් කළ යුතුය. සිය සුදුසුකම් සනාථ කිරීම සඳහා අදාළ සහතිකපත්වල පිටපත් අමුණා එවිය යුතුය. රාජ්‍ය අංශයේ සේවයේ නියුතු සේවකයින්ගේ අයදුම්පත් සිය අදාළ ආයතනවල ප්‍රධානීන් මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. ඉහත අවශ්‍යතාවන්ට අනුකූල නොවන අයදුම්පත් හා අසම්පූර්ණ අයදුම්පත් හා ප්‍රමාදවී, අයදුම්පත් භාර ගන්නා වේලාව අවසාන වීමෙන් පසු ලැබෙන අයදුම්පත්ද ප්‍රතික්ෂේප කරනු ලැබේ. අනිසි අයථා බලපෑම් කිරීම්, නුසුදුසුකමක් ලෙස සලකනු ලැබේ. අයදුම් කරනු ලබන තනතුර ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ සටහන් කළ යුතුය. ඔබගේ අයදුම්පත් පහත ලිපිනයට යොමු කරනු මැනවි.

**අධ්‍යක්ෂ ජනරාල්,**
**පාරිභෝගික කටයුතු අධිකාරිය,**
**2 වන මහල, සතොස මහ ලේකම් කාර්යාල ගොඩනැගිල්ල,**
**අංක 27, වොක්ෂෝල් වීදිය, කොළඹ 02.**